සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

26939

## 9 - ශ්‍රේණිය

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය:- ..................................................................................... කාලය: පැය 2යි.

උපදෙස් :- I කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
II කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා I කොටසට අමුණා බාර දෙන්න.

## I කොටස

1. ‘චන්ද්‍රිකා තාක්ෂණයේ පියා’ ලෙස විරුදාවලිය ලත් ගෞරවනීය ශ්‍රී ලාංකික පුරවැසියා,
   1. සෙනරත් පරණවිතාන මහතාය.
   2. ආතර් සී.ක්ලාක් මහතාය.
   3. සිරිල් පොන්නම්පෙරුම මහතාය.
   4. ඇල්බට් අයින්ස්ටයින් මහතාය.

2. පිරමීඩ ඉදිකිරීමේ තාක්ෂණය ලොවට දායාද කළ ශිෂ්ටාචාරය වන්නේ,
   1. නයිල් නිම්න ශිෂ්ටාචාරය යි.
   2. මායා ශිෂ්ටාචාරය යි.
   3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය යි.
   4. හොවැංහෝ ශිෂ්ටාචාරය යි.

3. ස්වාභාවික ආපදාවලට හේතු වන ජෛවීය සාධකයක් වන්නේ,
   1. ජල ගැලීමය.
   2. නියඟයයි
   3. ලැව් ගිනිය.
   4. වසංගත රෝගයි.

4. ජීවන වෘත්තියක් ලෙස රූපලාවන්‍ය කටයුතුවල යෙදීම,
   1. සේවා අංශයේ රැකියාවකි.
   2. කාර්මික අංශයේ රැකියාවකි.
   3. කෘෂිකාර්මික අංශයේ රැකියාවකි.
   4. අර්ධ කාලීන රැකියාවකි.

5. පුරවැසියකු සතු සිවිල් අයිතිවාසිකමක් නොවන්නේ,
   1. පෞද්ගලික නිදහස යි.
   2. කැමති වෘත්තියක නිරත වීමයි.
   3. ජීවත්වීමේ අයිතියයි
   4. ඡන්ද අපේක්ෂකත්වය ලැබීමයි.

- අංක 6-10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දී ඇති වාක්‍යය නිවැරදි නම් ‘නි’ යන්න වටා ද වැරදි නම් ‘වැ’ යන්න වටා ද රවුමක් අඳින්න.

6. සංස්කෘතිය පවරා දීම හා ආරක්ෂා කිරීම පාසලෙන් ඉටුවන කාර්යයකි. (නි / වැ)

7. “එකා සැමටත් සැම එකාටත්” යනු සමුපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨයයි. (නි / වැ)

8. හැඟීම්වල ග්‍රහණයෙන් මිදීම තීරණ ගැනීමේ දී සැලකිලිමත් විය යුතු නොවේ. ( නි /වැ )

9. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ මැතිවරණයක දී සිදු වන්නේ බහුතර කැමැත්ත මැන බැලීමයි. (නි / වැ)

10. ලද දෙයින් සතුටු වන තැනැත්තාට මානසික කලකිරීම් හා බිඳ වැටීම් ඇති නොවේ. ( නි /වැ )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී X තීරුව හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. කලාව තුළින් උදාර පෞරුෂයක් ගොඩනගා ගත් පුද්ගලයෙකි. | A. ජෙෆ්රි බාවා |
| 2. ලෝක පූජිත අගාකාන් සම්මානයෙන් පිදුම් ලද පුද්ගලයා | B. ඩී. ඩබ්ලිව්. විමලසුරේන්ද්‍ර |
| 3. 'ජල විදුලි බලයේ පියා' යන විරුදාවලියෙන් හඳුන්වනු ලබන්නේ | C. ලුවී බ්‍රේල් |
| 4. අන්ධ පුද්ගලයින්ට ලිවීමට කියවීමට අංග සම්පූර්ණ භෝඩියක් ගොඩ නැඟීම | D. චාල්ස් ඩිකන්ස් |
| | E. මහගමසේකර |

(1) ABDE (2) ABED (3) EABC (4) EACB

12.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. අධිෂ්ඨානය හා කැපවීම | A. ස්වයං තක්සේරුව. |
| 2. තම හැකියා හඳුනා ගැනීම | B. සමාජ ප්‍රගමනයට හේතු වේ. |
| 3. ආයතනයක ඉලක්ක සපුරා ගැනීම | C. වෘත්තීය මාර්ගෝපදේශය. |
| 4. ඵලදායී ජීවන වෘත්තියක් තෝරා ගැනීම | D. ඵලදායී ආයතනයක ලක්ෂණයකි. |
| | E. වෘත්තීය සංවර්ධනය සඳහා තිබිය යුතුය. |

(1) CABD (2) EADC (3) DABE (4) BACB

13.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. බස්නාහිර පළාත | A. රත්නපුර දිස්ත්‍රික්කය |
| 2. දකුණු පළාත | B. බදුල්ල දිස්ත්‍රික්කය |
| 3. සබරගමු පළාත | C. හම්බන්තොට දිස්ත්‍රික්කය |
| 4. ඌව පළාත | D. ගම්පහ දිස්ත්‍රික්කය |
| | E. කුරුණෑගල දිස්ත්‍රික්කය |

(1) DCBA (2) DECA (3) ABCD (4) DCAB

14.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. සමථ මණ්ඩලය | A. යුක්තිය පසිඳලීම |
| 2. ඔම්බුඩ්ස්මන් | B. අපරාධකරුවන් නීතිය ඉදිරියට යොමු කිරීම |
| 3. පොලිසිය | C. රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම |
| 4. අධිකරණය | D. සුළු ආරවුල් විසඳීම |
| | E. මූලික අයිතිවාසිකම් කඩ වුවහොත් ගත හැකි ක්‍රියා මාර්ග දක්වා තිබීම. |

(1) DBAC (2) DCBA (3) BCDA (4) DCAB

15.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. ගැටුමක් ඵලදායි විය හැකි අවස්ථාවකි. | A. ක්‍රියාකාරිව සවන් දීම. |
| 2. ගැටුම විනාශකාරී විය හැකි අවස්ථාවකි. | B. ස්ථිරසාර බව. |
| 3. ගැටුම් නිරාකරණ කුසලතාවකි. | C. පක්ෂග්‍රාහී වීම. |
| 4. ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමේ සාර්ථක පිළිවෙතකි. | D. ගැටුම නිසා වැදගත් කරුණක් නිරාකරණය වීම. |
| | E. දුර දිග නොබලා තීරණ ගැනීම |

(1) DEAB (2) DEBA (3) BACD (4) CEBA

• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

16. පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නේ ................................ මහ පෙන්වීම යටතේය.
(නගර සභා, ප්‍රාදේශීය සභා, මධ්‍යම ආණ්ඩුව)

17. භූගෝලීය වශයෙන් දුරස්ථ බව ඉක්මවා සාමාජීය වශයෙන් ලෝකය සමීපව කටයුතු කිරීම ............ ........................................... ලෙස හඳුන්වයි.
(කාර්මීකරණය,ගෝලීයකරණය,සන්නිවේදනය)

18. 'ජනතාව විසින් ජනතාව උදෙසා කරනු ලබන පාලන ක්‍රමය ........................................ ලෙස හඳුන්වයි.
(ඒකාධිපතිවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය)

19. අන්‍යෝන්‍ය රැදියාව සහ සහජීවනය ආරම්භ වන්නේ ................................................ තුළිනි.
(පාසල, පවුල, සමාජය)

20. කිසියම් අභියෝගයක් හමුවේ පුද්ගලයන් ප්‍රතිචාර දක්වන ක්‍රමයක් නොවිය යුත්තේ ................................... ය.
(ආක්‍රමණශීලී බව, ස්ථිරසාර බව, සවන්දීම)

(ලකුණු 2 x 20 = ලකුණු 40)

## II කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(1) තුන් වන වාර අවසාන ඇගයීම සඳහා පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතු යන මාතෘකාව යටතේ සකස් කරන ලද ප්‍රශ්නෝත්තර සංග්‍රහය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ ප්‍රදේශයේ ඇති පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සඳහා ඔබ විසින් සකස් කළ ප්‍රශ්න දෙකක් ලියන්න. (ලකුණු 2)

(iii) ඔබගේ කණ්ඩායමේ වෙනත් යහළුවෙක් පළාත් පාලන ආයතන සම්බන්ධව සකස් කළ තවත් ප්‍රශ්න දෙකක් ලියන්න. (ලකුණු 2)

(iv) ඔබ පන්තියේ වෙනත් කණ්ඩායමක් විසින් සකස් කරන ලද පහත ප්‍රශ්න දෙකට ඔබ විසින් ලබා දෙන පිළිතුරු සඳහන් කරන්න.
(a) පළාත් පාලන මැතිවරණ පවත්වන්නේ වසර කීයකට වරක් ද?
(b) මහ නගර සභාවක ප්‍රධාන විධායක නිලධාරියා නම් කරන්න. (ලකුණු 4)

(v) මෙවන් ඇගයීමක් පන්ති කාමරයේ සිදු කිරීමෙන් ඔබ ලබාගත් අත්දැකීම් තුනක් ලියන්න. (ලකුණු 3)

(vi) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සකස් කර අවසන් වූ පසු ඔබගේ පන්තියේ සිසුන් එය ප්‍රයෝජනයට ගත් ආකාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(මුළු ලකුණු 16කි )

(2) එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී නොයෙක් තීරණ ගැනීමට අපට සිදු වේ.

(i) අප එදිනෙදා ගන්නා තීරණ බෙදිය හැකි ප්‍රධාන වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) තීරණ ගැනීමේ දී අප වඩාත් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) සුමේධ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙකි. ඔහුගේ මව අසනීපයෙන් පසු වන්නීය. නංගී සහ මල්ලී කුඩා දරුවන්ය. වාර අවසාන විභාගයට ඇත්තේ දින හතරකි. පියා හදිසි අනතුරකින් රෝහල් ගත කරන්නේ මේ අතරතුරය. දවල්ට පියාට ආහාර ගෙන යැමටත්, රාත්‍රියේ දී පියා ළඟ සිටීමටත් සිදුවන්නේ සුමේධටය.

(a) ඉහත සිද්ධිය අනුව සුමේධට මුහුණ දීමට සිදු වන අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 2)

(b) ඒ අනුව ඔහු ගත යුතු යහපත් ක්‍රියාමාර්ගයක් ලියා එයින් ඇති වන වාසි පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 3)

(3) (i) ගැටුමක් යනු කුමක්දැයි ඔබට හැඟෙන ආකාරයට ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) ගැටුම හසුරුවා ගන්නා ආකාරය අනුව ගැටුමේ ප්‍රතිඵල ඵලදායී හෝ විනාශකාරී විය හැකිය.

(a) ගැටුමක් ඵලදායී වන අවස්ථා දෙකක් හා

(b) ගැටුමේ ප්‍රතිඵල විනාශකාරී විය හැකි අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) ඔබ උගත් ගැටුම් නිරාකරණ කුසලතා සම්බන්ධ කරගෙන පාසලේ දී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටුම් අවස්ථාවක් ඵලදායී ලෙස නිරාකරණය කරගත් අයුරු විස්තර කරන්න. (ලකුණු 5)

(4) සමාජ සුරක්ෂිතතාවය යනු සමාජයේ ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු වීමයි.

(i) සමාජ සුරක්ෂිතතාවය ඇති කරන විධිමත් ආයතනයක් ලෙස පොලීසිය මඟින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) සමාජ සුරක්ෂිතතාවය බිඳ වැටීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයාය. සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා පුද්ගලයන් සතු වගකීම් දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 5)

(5) (i) 'තාක්ෂණය' යන්න සරලව අර්ථ දක්වන්න. (ලකුණු 2)

(ii) නව තාක්ෂණික වෙනස්වීම් සමඟ සමාජයේ ඇති වී තිබෙන වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) නිර්මාණශීලී පුද්ගලයෙකු ලෙස තාක්ෂණික වෙනස්වීම් සමාජයට හිතකර ලෙස යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 5)

(6) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කර ඇති දේශපාලන චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)

(ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටවල් හතරකට උදාහරණ දෙන්න. (ලකුණු 4)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට බලපාන අංග දෙකක් සඳහන් කර, එමඟින් ප්‍රජාතන්ත්‍රවාදය සුරකෙන ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

(7) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ජනතාවට පාලනයට සහභාගී වීමට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) සර්වජන ඡන්ද බලය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ දක්නට ලැබෙන ලක්ෂණයකි. සර්වජන ඡන්ද බලයේ වැදගත්කම පිළිබඳ වාක්‍ය දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) පළාත් පාලන ආයතන මඟින් මහජන සුවපහසුව සඳහා ඉටු කරන කාර්යයන් තුනක් ලියා විස්තර කරන්න. (ලකුණු 5)